

## කටුනායක රොෂෙන්ට අපේ ආචාරය

ලියා දන්වන වග යි

ලංකාවේ කම්කරු සටන් ඉතිහාසය තුළ අයිතීන් උදෙසා කළ අරගල වලදී දිවි දුන් කන්දසාමි, ගෝවින්ද, මාතුපාල, අල්විස්, රබෙල්, පියදාස, සාදිරිස්, නිකලස්, එලියතම්බි, සෝමපාල , කිත්සිරිමෙවන්, ලෙස්ලි ආනන්ද යන නාමාවලියට එක් වූ අලුත්ම සාමාජිකයා කටුනායක රොෂෙන් චානක ය.

කටුනායක රොෂෙන් මුලින් කී සියලු දෙනාටම වඩා සුවිශේෂී වන්නේය. කලින් සඳහන් කළ දවි පිදූ සියල්ලන්ම ජීවිත පූජා කරන ලද්දේ තම අයිතිනීන් ඉල්ලා පවතින රාජයට එරෙහිව වීදි බට මොහොතේදීය. එහෙත් රොෂෙන් ජීවිතය පූජා කළේ රජය විසින් බලහත්කාරයෙන් කම්කරුවන් මත පටවන්නට උත්සාහ කරන ලද ඊනියා විශ්‍රාම පැටුප ප්‍රතික්ෂෙප කරන උද්ඝෝෂණයකදී ය.

යුද ජයග්‍රහණය හරාහා ලද කීර්තිය, ජනාධිපති ජයග්‍රහණය හා ව්‍යවස්ථා සංශෝධනය හරහා ලබා ගත් නීතිමය බලතල මතින් සවිමත්ව උද්ධච්ඡ හැසිරීමක යෙදෙන ආණ්ඩුවට එරෙහිව කිසිත් කළ නොහැකි තත්වයක් තුළ, ආණ්ඩුවට එරෙහි වන සියලුම බලවේග මර්දනය කරමින්, විශේෂයෙන් කම්කරු බලවේග නිහඬ කිරීම සඳහා ඕනෑම ආකාරයක මර්ධනයකට ආණ්ඩුව පසුබට නොවන තත්වයක් තුළ, බුද්ධිමකතුන් කලාකරුවන් දේශප්‍රේමීන් සියල්ලන්ම නිද්‍රාවට වැටී සිටින මෙහොතක සමාජය විසින් කෑලි ගණනට වර්ග කරනු ලැබ ඇති කලාපයේ කම්කරු සහෝදරයන් හා සහෝදරියන් එක් වී කරන ලද මේ උදඝෝෂණ ව්‍යාපාරය කම්කරු මර්දකාරී පාලනයකට එරෙහිව ඇරඹුන පළමුවන වෙඩි මුරය බවට පත් විය යුතු ය, කාලාන්තරයක් තිස්සේ ඇද වැටී සිටින ලාංකේය කම්කරු පන්තියට මේ උද්ඝෙෝෂණය සැබැවින්ම නව ජවයක් විය යුතුය.

සැබෑ දේශප්‍රේමීයෝ සිටිත් නම්, සැබෑ කම්කරු නායකයෝ සිටිත් නම්, සැබෑ මානව හිතකවාදීයෝ සිටිත් නම් අසාධාරණයට එරෙහිව එකාවන්ව පෙළ ගැසිය යුතු වේලාවක් පැමිණ ඇතැයි අපට සිතෙයි,

මහජන මතය තඹයකට හෝ මායිම් නොකර හිතුවක්කාර හැසිරීමක යෙදෙන ආණ්ඩුවලට අත් වන ඉරණම ඉතිහාසය අපට පෙන්වා දී ඇත. මහින්ද රාජපක්ෂ මහතා ද එකල මහජනතාවගේ පැත්තේ සිට ඒ සියල්ල බලා සිටි ප්‍රේක්ෂකයක්ව සිටි බව අපට මතක ය.

**සංස්කාරක**

**සංස්කාරක සටහන**

නව සහශ්‍රයට සන්නස පුවත්පත විවෘත වේදිකාවකි. මෙහි පළවන ලිපි වල අන්තර්ගත වන්නේ එම ලිපි ලියන ලේඛකයනගේ අදහස් ය. ඒ ලිපි තුළින් කතා බහ කෙරෙන කාරණා පිළිබඳව ඔබට ද මතයක් ඇත්නම් ඔබේ අදහසට ද ඉඩක් ලබා දෙන්නට අපි සැමවිටම උත්සාහ කරන්නෙමු. ඔබේ ලිපිය **ඉතා කෙටියෙන්** ලියන්න. පුවත් පතේ ඉඩ, අදහස නිරවුල් ව ඉදිරිපත් නොකිරීම, වැරදි භාෂාව, වැනි හේතු මත සියලුම ලිපි සංස්කරණයට භාජනය විය හැකි බව සළකන්න අනන්‍යතාව හෙළි නොකර එවන ලිපි සඳහා පුවත්පතේ ඉඩක් නොලැබෙන බවද කරුණාවෙන් සළකන්න .




පෞද්ගලික අංශයේ කාන්තාවන් වයස අවු. 50 දී විශ්‍රාම ගන්වන අතර පිරිමින් වයස අවු. 55 දී විශ්‍රාම ගන්වයි. මේ ගැන කම්කරු ඇමැතිවරයා පවසන්නේ හාම්පුතුන් සමග කතාකර ඔවුන්ගේ විශ්‍රාම යැමේ වයස් සීමාව 60 දක්වා දීර්ඝ කිරීමට ඉල්ලීමක් කරන බවයි. ඔවුන් එම ඉල්ලීම පිළිගනීද? එසේම දීර්ඝකාලීනව සාමාජික මුදල ගෙවා කල්පිරීමට පෙර බර පැන දරන්නේ රටේ මහජනතාවයි.

යෝජිත පෞද්ගලික අංශයේ සේවක විශ්‍රාම වැටුප ආරම්භ වන්නේ අනාගතයේ රටේ යැපෙන වැඩිහිටි ජනතාව රටට බරක් වන නිසා බව පැවැසේ. ශ්‍රී ලංකාවේ යැපෙන ජනගහන ප්‍රතිශතය 60% පමණ වන අතර ඉන් 34% ළමුන්ද 21% වැඩිහිටියන් ද ලෙස අනුමාන කරයි.

# බලහත්කාරයෙන් දෙන්න හදන විශ්‍රාම වැටුප

**ජනතා හිතෛෂී වගකිවයුතු රජයක් පනතක් ඉදිරිපත් කිරීමේදී එහි විශ්වසනීයත්වයක් තිබිය යුතුය.**

ඉවත්ව යන අයට යම් කොටසක් ගෙවීමට සංශෝධන ඉදිරිපත් කරන බව පවසයි. ජනතා හිතෛෂී වගකිවයුතු රජයක් පනතක් ඉදිරිපත් කිරීමේදී එහි විශ්වාසනීයභාවයක් තිබිය යුතුය. අද අඩුපාඩු පෙන්වා දෙන තරමට එය සංශෝධනය කරන්න බලනවා යෑයි කීම යුක්ති යුක්තද?

පෞද්ගලික අංශයේ සේවකයන් සඳහා නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් ක්‍රියාත්මක කරන බවට පසුගිය අයවැය කථාවේදී ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා පොරොන්දු වූ අතර එය වැඩකරන ජනතාවගේ දිනය වන ජාත්‍යන්තර කම්කරු දිනය වන මැයි 1 වැනිදා ඉදිරිපත් කිරීමට නියමිත විය. නමුත් මෙම විශ්‍රාම වැටුප් ක්රමයේ ගැටලූකාරී තත්ත්වයන් හේතුවෙන් විවිධ පාර්ශ්වයන් එයට විරුද්ධ වීම නිසා එය ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

දැනට අප රටේ විශ්‍රාම වැටුපකට හිමිකම් කියන්නේ රාජ්‍ය අංශයේ සේවකයන් පමණි. රටට කරන සේවය වෙනුවෙන් ඔවුහු මාසික වැටුපක් ලබන අතර කළ සේවයට උපහාරයක් ලෙස විශ්‍රාම වැටුපකට ද හිමිකම් ලබති. රාජ්‍ය නායකයාගේ සිට පාර්ලිමේන්තු මැති ඇමැතිවරුන්, මන්ත්‍රීවරුන් ඔවුන්ගේ කාර්ය මණ්ඩල සේවකයන්ට වසර පහකින් පසු විශ්‍රාම වැටුප් හිමිකම ලැබෙන අතර අනෙකුත් රාජ්‍ය සේවකයන්ට වසර 10 ක් සේවා කාලයකින් පසු විශ්‍රාම වැටුප් හිමිකම් ලැබේ. එය තමා ලැබූ වැටුපෙන් 70% * 85% අතර ප්‍රමාණයක් වේ. මෙහි වසර 2041 දී මෙම යැපෙන ජනගහනය 74.4% ක අගයක් ගන්නා බවට අනුමාන කරන අතර ඉන් 42.5% වැඩිහිටි ජනගහනය වනු ඇතැයි අනුමාන කෙරේ. මෙසේ වැඩිවන වැඩිහිටි ජනගහනය අනාගතයේ රටට බරක් යෑයි සලකා රජය රාජ්‍ය අංශයේ සේවකයන්ට මෙන්ම පෞද්ගලික අංශයේ සේවකයන්ටත් විශ්‍රාම වැටුපක් යෝජනා කරයි.

බණ්ඩාර කපිලරත්න

එය අනාගතය ගැන හිතා කරන කාලෝචිත යෝජනාවක් විය හැකි ය.

දැනට පෞද්ගලික අංශයේ සේවකයන්ගේ අනාගත රැකවරණය සඳහා ඇත්තේ සේවක අර්ථසාධක අරමුදල, සේවය භාරකාර අරමුදල හා සේවයෙන් ඉවත්ව යනවිට ලැබෙන පාරිතෝෂික දීමනාව පමණි. අනාගතය ගැන සිතා කටයුතු කරන බොහෝ අය එම මුදල් බැංකුවක තැන්පත් කර එම පොලියෙන් ජීවත්වෙති. නමුත් එම මුදලට වැඩි පොලියක් ලබාගැනීමේ අරමුණෙන් සක්විති වැනි ව්‍යාජ

11 වන පිටට


සන්නස නව සහශ්‍රයට SANNASA

**Sannasa**
61 Nettle Drive
Hallam Vic 3803 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasanews@gmail.com
Tel/Fax :03 9796 4241**after 4pm**

**සංස්කරණය / Editor**
අසෝක සුබසිංහ
Asoka Subasinghe

**සංස්කරණ උපදේශක / Editorial Advisor**
ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සහය සංස්කාරක / Asst. Editor**
ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage

**ක්‍රීඩා සංස්කාරක / Sports Editor**
අසෝක සිල්වා Asoka Silva

**රූ රටා / Graphics**
ශානලී එදිරිසිංහ Shanalee Edirisinghe

**වෙළඳ දැන්වීම් / Advertising**
03 8707 4604
0402 025 516
**email** ads.sannasa@gmail.com

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ශ්‍රියාණි මද්දුමගේ

පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස නව සහශ්‍රයට පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත

**සේයා රූ / Photography**
Prasanna Kurukularatna

**සම්බන්ධීකරණය**
**NSW** Lakshman Kodituwakku 02 9626 7660 02 9837 5055
**WA** Kapila Hemantha Balage 08 9456 1972
**QLD** Ananada Samaratunga 07 3372 7953
**ACT** Asoka Nimalasiri 0400 429 031
**SA** Chandra Eeriyagama 08 8331 2318